# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 53 දරන
# ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනත

---

[සහතිකය සටහන් කළේ අගෝස්තු මස 23 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 අගෝස්තු මස 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 90 යි    තැපැල් ගාස්තුව : ශත 25 යි

# 1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනත

[සහතිකය සටහන් කළේ 1979 අගෝස්තු මස 23 වන දින]

එල්. ඩී.—ඕ. 62/78.

**ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම යනුවෙන් හඳුන්වනු ලබන පොදු අධිකාරියක් පිහිටුවීම සඳහා ද ශ්‍රී ලංකා නව නිපැයුම් වලට සහ ඒවා නිෂ්පාදනය කිරීමට අනුග්‍රහ දැක්වීම හා ධෛර්යදීම සඳහා ද ඒවාට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මේ පනතෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය. — *ලුහුඩු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.*

2. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු (මේ පනතේ මින් මතු "කොමිසම" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරියක් නියමිත දිනයේ දී පිහිටුවිය යුතු අතර, 4 වන වගන්තිය යටතේ තත් කාලයෙහි කොමිසමේ සාමාජිකයන් ව සිටින තැනැත්තන්ගෙන් ඒ අධිකාරිය සමන්විත විය යුතු ය. — *කොමිසම පිහිටුවීම.*

3. කොමිසම 2 වන වගන්තියෙන් ඊට පවරන ලද නාමයෙන් යුක්ත සංස්ථාවක් විය යුතු ය. තව ද, ඊට අවිච්ඡින්න පැවැත්මක් ඇති අතර පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තව ද කොමිසම විසින් ද කොමිසමට විරුද්ධව ද සංස්ථා නාමයෙන් නඩු පවරනු ලැබිය හැකි ය. — *කොමිසම සංස්ථාවක් වන බව.*

4. (1) අමාත්‍යවරයාගේ නිර්දේශය මත අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන කොමසාරිස්වරයකුගෙන් සහ සහකාර කොමසාරිස්වරයන් දෙදෙනකුගෙන් කොමිසම සමන්විත විය යුතු ය. — *කොමිසමේ සාමාජිකයෝ.*

(2) ඒ කොමසාරිස්වරයා සහ සහකාර කොමසාරිස්වරයන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් ද විය යුතු අතර නව නිපැයුම් එකක හෝ ඊට වැඩි ගණනක නව නිපැයුම්කරුවන් ලෙස ශ්‍රී ලංකාවේ පේටන්ට් බල පත්‍ර පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි වූ නව නිපැයුම් කරුවන් විය යුතු ය.

(3) අමාත්‍ය මණ්ඩලයේ මතය අනුව, කොමිසමට පත් කිරීමට තරම් නිසි පරිදි සුදුසුකම් ලත් තැනැත්තකු නොමැති අවස්ථාවක, විද්‍යාත්මක හෝ කාර්මික ක්ෂේත්‍රයෙහි විශිෂ්ටත්වයක් ලබා ඇති තැනැත්තකු හෝ කොමිසමේ කටයුතුවල යම් අංශයක් සම්බන්ධයෙන් වෙනත් ආකාරයක විශේෂ සුදුසුකම් ලත් තැනැත්තකු හෝ තාවකාලික වශයෙන් කොමිසමට පත් කරනු ලැබිය හැකි ය.

ඒ 42338 — 12.8000 (79/07)

(4) යම් තැනැත්තෙක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් නම්, ඒ තැනැත්තා කොමිසමේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ කොමිසමේ සාමාජිකයකු වශයෙන් දිගටම කටයුතු කර ගෙන යාමට හෝ නුසුදුසු විය යුතු ය.

සාමාජිකයන්ගේ ධූර කාලය.

5. (1) 6 වන වගන්තියේ විධිවිධානවලට යටත් ව, කොමිසමේ සාමාජිකයන්ගේ ධූර කාලය අවුරුදු තුනක් විය යුතු ය:

එසේ වුව ද, ධූරයෙන් ඉල්ලා අස් වන හෝ ධූරයෙන් ඉවත් කරන ලද හෝ වෙනත් ආකාරයකින් ධූරය හිස් කරන සාමාජිකයකු වෙනුවට පත් කරනු ලැබූ සාමාජිකයකු විසින් ඔහු කලින් ඉල්ලා අස්වුවහොත් හෝ ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ වෙනත් ආකාරයකින් ධූරය හිස් කළහොත් හෝ හැර, ඔහු අනුප්‍රාප්ත වූයේ යම් සාමාජිකයකු වෙනුවට ද ඒ සාමාජිකයාගේ ධූර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධූරය දැරිය යුතු ය.

(2) ධූර කාලය ඉකුත් වීම හේතු කොටගෙන ධූරය හිස් කරන කොමිසමේ යම් සාමාජිකයකු නැවත පත් කරනු ලැබීමට සුදුසු විය යුතු ය.

සාමාජිකයන් ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම.

6. (1) කොමිසමේ සාමාජිකයකුට අමාත්‍යවරයා වෙත ලිපියක් යවා තම ධූරයෙන් ඉල්ලා අස් විය හැකි ය.

(2) කොමිසමේ සියලු සාමාජිකයන් යහ පැවැත්මෙන් සිටින තාක් කල් ධූරය දැරිය යුතු අතර, අමාත්‍ය මණ්ඩලය විසින් ඔවුන් ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) රෝගීභාවය, ශ්‍රී ලංකාවෙන් බැහැර ගොස් සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා තම ධූරයේ කාර්යය ඉටු කිරීමට යම් සාමාජිකයකුට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, සාමාජිකයකු වශයෙන් ඔහු වෙනුවට ක්‍රියා කිරීමට වෙනත් යම් තැනැත්තකු අමාත්‍ය මණ්ඩලය විසින් 4 වන වගන්තියේ විධිවිධානවලට යටත් ව පත් කරනු ලැබිය හැකි ය.

කොමිසමේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

7. කොමිසමේ සාමාජිකයන්ට, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වයක් ඇතිව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි ය.

කොමිසම විසින් ගනු ලබන යම් තීරණයකට අදාළ කරුණකට සාමාජිකයන්ගේ ඇති සම්බන්ධතා හෙළිදරව් කළ යුතු බව.

8. කොමිසමේ කටයුතු කිසිවක විෂයය වන්නා වූ හෝ කොමිසම විසින් ගනු ලැබීමට යෝජිත යම් තීරණයක විෂයය වන්නා වූ යම් කරුණක් පිළිබඳව කෙළින් ම හෝ අන්‍යාකාරයකින් සම්බන්ධතාවක් ඇති කොමිසමේ සාමාජිකයකු විසින්, තමාට ඇති ඒ සම්බන්ධතාවේ ස්වභාවය කොමිසමේ රැස්වීමක දී ලියවිල්ලක් මගින් හෙළිදරව් කළ යුතු අතර, ඒ කරුණ සම්බන්ධයෙන් කරනු ලබන කටයුතු කිසිවකට හෝ ඒ කරුණ සම්බන්ධයෙන් ගනු ලබන යම් තීරණයකට හෝ ඒ සාමාජිකයා සහභාගි නොවිය යුතු ය.

9. කොමිසම විසින් කරනු ලබන යම් ක්‍රියාවක් හෝ කටයුතු කිසිවක්, කොමිසමේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතීමේ නැතහොත් කොමිසමේ යම් සාමාජිකයකු පත් කිරීමේ ලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් බලරහිත වන්නේ යයි ප්‍රකාශ කට පත් නොකළ යුතු ය. පුරප්පාඩුවක් තිබුණ ද, කොමිසමට ක්‍රියා කළ හැකි බව.

10. කොමිසමේ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු ය :— කොමිසමේ පරමාර්ථ.

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියන් විසින් නව නිපැයුම් කරනු ලැබීම හෝ නිර්මාණය කරනු ලැබීම සඳහා ඔවුන්ට ධෛර්යදීම;

(ආ) නව නිපැයුම්කරුවන්ට තාක්ෂණික, මුදල් සහ නීති ආධාර දීම;

(ඇ) මේ පනත යටතේ කොමිසම වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ හෝ සියලු බලතල, කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කිරීම, කිරීම හා ඉටු කිරීම; සහ

(ඈ) මේ වගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමට අවශ්‍ය වන හෝ උපකාරී වන වෙනත් සියලු ක්‍රියා හෝ දේ කිරීම.

11. (1) කොමිසමේ බලතල, කර්තව්‍ය හා කාර්ය පහත දැක්වෙන පරිදි විය යුතු ය :— කොමිසමේ බලතල, කර්තව්‍ය හා කාර්ය.

(අ) කොමිසම විසින් නියම කරනු ලබන නියමවලට හා කොන්දේසිවලට යටත්ව, නව නිපැයුම්කරුවන්ගේ නව නිපැයුම් සඳහා පේටන්ට් බලපත්‍ර නිකුත් කළ හැකි දැයි තීරණය කිරීම පිණිස ඒවා පරීක්ෂා කිරීමෙන් පසු ඒ නව නිපැයුම්කරුවන්ට තාක්ෂණික ආධාර දීම සහ පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍ර පිළියෙල කිරීමට ඔවුන්ට උපකාර කිරීම;

(ආ) නව නිපැයුම්කරුවන්ගේ පේටන්ට් බලපත්‍ර නිකුත් කරන ලද නව නිපැයුම් හෝ පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති නව නිපැයුම් හෝ වැඩි දියුණු කිරීම, පරිපූර්ණ කිරීම හා නිෂ්පාදනය කිරීම සඳහා කොමිසම විසින් නියම කරනු ලබන නියමවලට හා කොන්දේසිවලට යටත්ව ඔවුන්ට මුදල් ආධාර දීම;

(ඇ) කොමිසම විසින් නියම කරනු ලබන නියමවලට හා කොන්දේසිවලට යටත් ව, නව නිපැයුම්කරුවන්ගේ පේටන්ට් බලපත්‍ර සඳහා වූ ඉල්ලුම් පත්‍ර ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයක දී හෝ ඉදිරිපත් කිරීමේ දී ඔවුන් නියෝජනය කිරීමෙන් සහ පේටන්ට් අයිතිය පිළිබඳ නඩුවල දී, නව නිපැයුම්කරුවන්ගේ ආරක්ෂිත පේටන්ට් අයිතිය උල්ලංඝනය කිරීම්වලින් ඔවුන් ආරක්ෂා කිරීමෙන් ඔවුන්ට නීති ආධාර දීම;

(ඈ) නව නිපැයුම්කරුවන්ගේ නව නිපැයුම් සෑදීම සඳහා, ඔවුන්ගේ පේටන්ට් අයිතිය පමණක් ඇපයට තබා ගෙන, ඔවුන්ට දීර්ඝ කාලීන ණය දීමට ආණ්ඩුවේ ණය දෙන ආයතනවලට හැකිවන පරිදි, ශ්‍රී ලංකාවට වැඩදායක නව නිපැයුම් පිළිබඳව ඒ ආයතනවලට නිර්දේශ කිරීම; දිය යුතු ණය මුදලේ ප්‍රමාණය, කොමිසම විසින් තීරණය කරනු ලබන පරිදි, ඔවුන්ගේ නව නිපැයුම්වල වැදගත්කම හා ඒවායේ අලෙවිය මත රඳා පැවතිය යුතු ය;

(ඉ) නව නිපැයුම්කරුවන්ගේ නව නිපැයුම් ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි අලෙවි කිරීම සඳහා නව නිපැයුම්කරුවන්ට උපකාර කිරීම;

(ඊ) කෘෂිකර්මය, රසායන විද්‍යාව, වෛද්‍ය විද්‍යාව, ජාතික ආරක්ෂාව, ඖෂධවේදය, භෞතික විද්‍යාව, මහජන ආරක්ෂාව සහ ශුභ සාධනය, පොදු කර්මාන්ත, ප්‍රවාහනය යන ක්ෂේත්‍රවල සහ වෙනත් එවැනි විද්‍යාත්මක හා තාක්ෂණ විද්‍යාත්මක ක්ෂේත්‍රවල ශ්‍රී ලංකාවේ දී පේටන්ට් බලපත්‍ර දෙන ලද නව නිපැයුම් සඳහා "නව නිපැයුම් පිළිබඳ ජනාධිපති ප්‍රදාන" යනුවෙන් හඳුන්වනු ලබන, සෑහෙන, මුදල් ත්‍යාග සහ පදක්කම් වාර්ෂිකව පිරිනැමීමෙන්, ශ්‍රී ලංකාවේ නව නිපැයුම්කරුවන්ගේ නව නිපැයුම් ප්‍රකට කිරීම සඳහා ඔවුන්ට ධෛර්ය දීම. ජාතිය පිළිබඳව විශේෂත්වයක් නොකොට ශ්‍රී ලංකාවේ නව නිපැයුම්කරුවන් සියලු දෙනාට ම මේ ප්‍රදාන විවෘතව තිබිය යුතු ය.

(උ) බලය දෙන ලද නව නිපැයුම්කරුවන්ට සහ පර්යේෂකයන්ට ස්වකීය අනුමත කළ නව නිපැයුම් සහ පර්යේෂණ කර ගෙන යාම සඳහා හෝ ඒවා පරිපූර්ණ කිරීම සඳහා පර්යේෂණ රසායනාගාර හෝ අත්හදා බැලීමේ මධ්‍යස්ථාන පහසුකම් හා සේවා ඔවුන්ට ලබා ගත හැකි වන පරිදි පොදු පර්යේෂණ රසායනාගාරයක් සහ අත්හදා බැලීම් මධ්‍යස්ථානයක් පිහිටුවීම හා පවත්වාගෙන යාම;

(ඌ) "නව නිපැයුම් පිළිබඳ ජනාධිපති ප්‍රදාන" තරඟවල ඒ ඒ විනිශ්චයකරුවන් විසින් තෝරා ගනු ලබන ජයග්‍රාහකයන්ට මුදල් ත්‍යාග හා පදක්කම් පිරිනැමෙන "නිර්මාණාත්මක පර්යේෂණ තරඟයක්" වාර්ෂිකව පැවැත්වීමෙන්, ශ්‍රී ලංකාවේ ජනතාව අතර නව නිපැයුම් කිරීම සහ නිර්මාණශීලීත්වය වැඩි දියුණු කිරීම සහ ඊට ධෛර්ය දීම සහ (ඊ) ඡේදයේ සඳහන් විද්‍යාත්මක හා තාක්ෂණ විද්‍යාත්මක ක්ෂේත්‍රවල අලුත් නව නිපැයුම් නිර්මිත කිරීමට ඔවුන්ට සහාය දීම;

(එ) නව නිපැයුම් සහ පර්යේෂණ පිළිබඳවත් පොදුවේ විද්‍යාව පිළිබඳවත් තොරතුරු පළ කිරීම සහ පතළ කර හැරීම;

(ඒ) නව නිපැයුම්කරුවන් අතර අදහස් හුවමාරු කර ගැනීම සඳහා මාසික රැස්වීම් නිතිපතා පැවැත්වීම;

(ඔ) නව නිපැයුම් සහ පර්යේෂණ සඳහා පැවැත්වෙන අන්තර් ජාතික තරගවලට සහභාගිවීමට ශ්‍රී ලාංකික නව නිපැයුම් කරුවන්ට උපකාරීවීම හෝ එවැනි තරගවලට ඔවුන් නිර්දේශ කිරීම; සහ

(ඕ) ශ්‍රී ලාංකික යෞවනයන් අතර නිර්මාණශීලිත්වය වැඩි දියුණු කිරීම සහ ඊට ධෛර්යදීම සඳහා පාසල්වල, විද්‍යාල වල සහ විශ්ව විද්‍යාලවල නිර්මාණාත්මක සමිති සංවිධා නය කිරීම.

(2) (1) වන උපවගන්තියේ (ඊ) ඡේදයේ සඳහන් මුදල් ත්‍යාග සහ පදක්කම් වාර්ෂිකව පිරිනැමීමේ කාර්යය සඳහා, ඒ ඡේදයේ සඳහන් ඒ ඒ ක්ෂෙත්‍රවල විශිෂ්ටත්වයක් ලබා සිටින තැනැත්තන් තිදෙනකුගෙන් සමන්විත වන විනිශ්චය මණ්ඩලයක් ජනාධිපති වරයා විසින් පත් කළ යුතු ය.

**12.** යම් නව නිපැයුම්කරුවකු විසින් හෝ පර්යේෂකයකු විසින් හෝ 11 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ) සහ (උ) ඡේද යටතේ කොමිසම විසින් සපයනු ලබන පහසුකම් ප්‍රයෝජනයට ගනු ලැබීමට පෙර, තමාට සැපයෙන පහසුකම්වල හෝ සේවාවල ප්‍රමාණය පදනම් කොට ගෙන, ඔහුගේ නව නිපැයුම්වලින් හෝ පර්යේෂණවලින් හෝ උද්ගත වන සියලු නිෂ්පාදන භාග වලින් සියයට දහයකට නොඅඩු ප්‍රමාණයක් පොදු පර්යේෂණ රසායනාගාරය හෝ අත්හදා බැලීම් මධ්‍යස්ථානය නඩත්තු කිරීම සඳහා කොමිසමට දීමට ඒ නව නිපැයුම්කරු හෝ පර්යේෂක විසින් ලියවිල්ලක් මගින් එකඟ විය යුතු ය. නව නිපැයුම් කරුවන්ට හෝ පර්යේෂකයන්ට පහසුකම් සැලසීම හෝ සේවා සැපයීම කළ යුත්තේ කවර කොන්දේසි යටතේ ද යන වග.

**13.** කොමිසම විසින් නිර්දේශ කරනු ලබන පරිදි, ලංකා විද්‍යාත්මක සහ කාර්මික පර්යේෂණ ආයතනයේ හෝ ආණ්ඩුවේ වෙනත් යම් පර්යේෂණ ආයතනයක හෝ ඇති රසායනාගාර පහසු කම් සහ සේවා අවශ්‍ය වන නව නිපැයුම්කරුවන්ට සහ පර්යේෂක යන්ට ඒ පහසුකම් හා සේවා සැපයිය යුතු ය. කොමිසම වෙත ස්වකීය රසායනාගාර පහසුකම් හා සේවා සැපයීමේ දී එකී යම් ආයතනයක් විසින් දරනු ලබන සියලු වියදම් කොමිසමෙන් අය කර ගනු ලැබිය යුතු ය. රසායනාගාර පහසුකම්.

**14.** නව නිපැයුම් වැඩි දියුණු කිරීමට හා ප්‍රවර්ධනය කිරීමට අදාළව යම් ලිඛිත නීතියක් මගින් සංස්ථාගත කළ නැතහොත් සංස්ථාගත නොකළ යම් තැනැත්තකු වෙත හෝ යම් පුද්ගල මණ්ඩලයක් වෙත හෝ පවරනු ලැබූ සියලු කර්තව්‍ය කොමිසම වෙත මෙයින් පවරනු ලබන අතර මින් මතු ඒ සියලුම කර්තව්‍ය කොමිසම විසින් ඉටු කළ යුතු ය. නව නිපැයුම් වැඩි දියුණු කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට අදාළ කර්තව්‍ය කොමිසමට පැවරීම.

**15.** (1) කොමිසමේ කටයුතු යථා පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ද කොමිසමේ කාර්ය මණ්ඩලය සේවයේ නියුක්ත කිරීම විධිමත් කිරීම සඳහා සහ සාමාන්‍යයෙන් මේ පනත යටතේ කොමිසමේ බලතල ක්‍රියාත්මක කිරීම හා කාර්ය ඉටු කිරීම සඳහා ද කොමිසම විසින් රීති සාදනු ලැබිය හැකි ය. රීති සෑදීමේ බලය.

(2) කොමිසම විසින් සාදනු ලද කිසිම රීතියක්, අමාත්‍යවරයා විසින් එය අනුමත කරන තුරු, බලාත්මක නොවිය යුතු ය.

කොමිසමේ කාර්යය සඳහා නිශ්චල දේපළ අත්කර ගැනීම.

16. (1) කොමිසමේ යම් කාර්යයක් සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීමට අවශ්‍යව ඇත්තා වූ ද ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ඒ යෝජිත අත්කර ගැනීම අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන්නා වූ ද අවස්ථාවක දී, ඒ දේපළ පොදු කාර්යයක් සඳහා අවශ්‍යව ඇති දේපළක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ඒ දේපළ අත්කර ගෙන, කොමිසම වෙත පවරනු ලැබිය හැකි ය.

(2) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ කොමිසම සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු යම් මුදලක් අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු ය.

ජනරජයට අයත් දේපළ විශේෂ ප්‍රදානයක් වශයෙන් හෝ බද්දක් යටතේ හෝ කොමිසමට දිය හැකි බව.

17. ජනරජයේ යම් නිශ්චල දේපළක් කොමිසමේ කාර්යය සඳහා අවශ්‍ය වන අවස්ථාවක, ඒ කාර්යය, රජයේ ඉඩම් ආඥා පනතේ 6 වන වගන්තිය යටතේ විශේෂ ප්‍රදානයක් වශයෙන් හෝ බද්දක් යටතේ හෝ ඒ දේපළ දිය හැකි කාර්යයක් ලෙස සැලකිය යුතු අතර, ඒ අනුව ඒ ආඥාපනතේ විධිවිධාන කොමිසමට ඒ දේපළ විශේෂ ප්‍රදානයක් වශයෙන් හෝ බද්දක් යටතේ හෝ දීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

කොමිසම සමග ගිවිසුම්වලට එළඹීමෙහි ලා පුද්ගල මණ්ඩලවලට හා පළාත් පාලන ආයතනවලට ඇති බලය.

18. සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ යම් පුද්ගල මණ්ඩලයක හෝ පළාත් පාලන ආයතනයක හෝ කර්තව්‍යවලට අදාළ යම් ලිඛිත නීතියක හෝ සාධන පත්‍රයක හෝ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, කොමිසමේ කාර්ය ඉටු කිරීම සහ එහි බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන සියලු ගිවිසුම්වලට සහ එකඟවීම්වලට ඇතුල් වී, ඒවා ඉටු කිරීම හෝ ඒවා ක්‍රියාත්මක කිරීම ඒ පුද්ගල මණ්ඩලය හෝ පළාත් පාලන ආයතනය විසින් කරනු ලැබිය හැකි ය.

මේ පනත යටතේ හෝ කොමිසමේ විධානය පිට හෝ කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව සැලසීම.

19. (1) (අ) මේ පනත යටතේ කොමිසම විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන හෝ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් කොමිසමට විරුද්ධව ; හෝ

(ආ) මේ පනත යටතේ හෝ කොමිසමේ විධානය පිට හෝ කොමිසමේ යම් සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන හෝ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට, නිලධරයාට, සේවකයාට හෝ අනුයෝජිතයාට විරුද්ධව

කිසිම සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් නො පැවරිය යුතු ය.

(2) කොමිසම විසින් හෝ කොමිසමට විරුද්ධව හෝ යම් අධිකරණයක පවරන ලද යම් සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් සම්බන්ධයෙන් කොමිසම විසින් දරන ලද වියදම් අරමුදලින් ගෙවිය යුතු අතර, එවැනි යම් සිවිල් නඩුවක දී හෝ අපරාධ නඩුවක දී කොමිසමට ගෙවූ හෝ කොමිසම විසින් අය කර ගනු ලැබූ යම් නඩු ගාස්තුවක් වේ නම්, එය අරමුදලට බැර කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ කොමිසමේ විධානය පිට හෝ කරන ලද නැතහොත් කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක ඔහුට විරුද්ධව පවරන ලද යම් සිවිල් නඩුවක දී හෝ අපරාධ නඩුවක දී ඒ ක්‍රියාව ඔහු විසින් සද්භාවයෙන් කරන ලදැයි ඒ අධිකරණය තීරණය කළ හොත්, ඔහු විසින් ඒ සිවිල් නඩුව හෝ අපරාධ නඩුව සම්බන්ධයෙන් දරන ලද වියදම් ඒ සිවිල් නඩුවේ දී හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් අය කර ගනු ලැබූ විටෙක දී හැර ඒ වියදම් අරමුදලින් ගෙවිය යුතු ය.

*කොමිසමේ සාමාජිකයකුට විරුද්ධව පෞද්ගලික තත්ත්වයෙහි ලා හෝ ඔහුගේ දේපලට විරුද්ධව හෝ රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.*

20. කොමිසමට විරුද්ධව පවරන ලද යම් නඩුවක දී, කොමිසමේ සාමාජිකයකුට විරුද්ධව පෞද්ගලික තත්ත්වයෙහි ලා හෝ ඔහුගේ දේපලට විරුද්ධව හෝ රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු ය.

*පරිපාලනය සහ කාර්ය මණ්ඩලය.*

21. (1) කොමිසමේ පරිපාලනය සඳහා පහත දැක්වෙන අංශ එහි පිහිටුවිය යුතු ය :—

(අ) පේටන්ට් බලපත්‍ර පිළිබඳව පරීක්ෂා කිරීමේ අංශය ;

(ආ) පර්යේෂණ අංශය ;

(ඇ) නීති අංශය ;

(ඈ) ඇගයුම් හා මුදල් අංශය ;

(ඉ) පරිපාලන අංශය ; සහ

(ඊ) අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, පිහිටුවිය යුතු යයි කොමිසම විසින් සලකනු ලබන වෙනත් අංශ.

(2) කොමිසමේ කර්තව්‍ය කිරීම සඳහා අවශ්‍ය වන කාර්මික, පරිපාලන සහ වෙනත් සේවකයන් පත් කිරීමේ හෝ සේවයේ නියුක්ත කිරීමේ බලය කොමිසමට තිබිය යුතු ය.

*කොමිසමේ අරමුදල.*

22. (1) අමාත්‍යවරයා විසින් කලින් කල දෙනු ලබන විධානවලට අනුකූලව, කොමිසම විසින් කළමනාකරණය කළ යුතු, පාලනය කළ යුතු සහ මෙහෙය විය යුතු (මේ පනතේ මින් මතු " අරමුදල " යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් පිළිබඳ අරමුදල යනුවෙන් හැඳින්වෙන අරමුදලක් පිහිටුවිය යුතු ය.

(2) පහත දැක්වෙන මුදල්, අරමුදලට ගෙවිය යුතු ය:—

(අ) යම් තැනැත්තකු විසින් හෝ ආණ්ඩුව විසින් හෝ කොමිසමට දෙනු ලබන ත්‍යාග හෝ මුදල් පරිත්‍යාග;

(ආ) 23 වන වගන්තිය යටතේ ආණ්ඩුවෙන් ලැබෙන ප්‍රදාන;

(ඇ) කොමිසම විසින් කරනු ලබන ආයෝජනවලින් කොමිසමට ලැබෙන යම් ආදායමක් හෝ කොමිසමට ලැබෙන වෙනත් මුදල්; සහ

(ඈ) නිෂ්පාදනභාග වශයෙන් ලැබෙන මුදල්.

(3) පහත දැක්වෙන මුදල්, අරමුදලින් ගෙවිය යුතු ය:—

(අ) කොමිසම පිහිටුවීමේ දී, නඩත්තු කිරීමේ දී සහ එහි කටයුතු කරගෙන යාමේ දී දරනු ලබන සියලු වියදම්;

(ආ) කොමිසමේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ වැටුප්; සහ

(ඇ) කොමිසමේ පරමාර්ථ ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය ගෙවීම් වශයෙන් කොමිසම විසින් අනුමත කරනු ලබන වෙනත් ගෙවීම්.

ආණ්ඩුව විසින් කොමිසමට ගෙවනු ලබන වාර්ෂික ප්‍රදානය.

23. කොමිසමේ අරමුණු සහ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා, පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන මුදල් ප්‍රමාණ, ආණ්ඩුව විසින් ඒකාබද්ධ අරමුදලින් කොමිසමට ප්‍රදානය කිරීම හෝ ණයක් වශයෙන් ගෙවීම හෝ කළ යුතු ය.

කොමිසම සහ ත්‍යාගදායකයන් ඇතැම් ගාස්තුවලින් සහ බදුවලින් නිදහස් කිරීම.

24. (1) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ ගෙවිය යුතු යම් ආදායම් බද්දකින්, ධන බද්දකින් හෝ වෙනත් බද්දකින් කොමිසම නිදහස් විය යුතු ය.

(2) මේ පනතේ විධිවිධාන යටතේ කොමිසමේ පරමාර්ථ සහ කාර්ය ඉටු කිරීම සඳහා ආනයනය කරනු ලබන සියලු භාණ්ඩ, ඒවා ආනයනය කිරීම මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන්නේ නම්, තීරු ගාස්තුවෙන් නිදහස් විය යුතු ය.

(3) යම් තැනැත්තකු විසින් පරිත්‍යාගයක් වශයෙන් යම් මුදලක් කොමිසමට ගෙවනු ලැබීමට විධිවිධාන සලස්වමින් ඒ තැනැත්තා සහ කොමිසම අතර ඇති කර ගත් යම් එකඟවීමක් අඩංගු වන යම් සාධන පත්‍රයක් මුද්දර ගාස්තුවෙන් නිදහස් විය යුතු ය.

(4) යම් තක්සේරු වර්ෂයකට පෙරාතුව වූ වර්ෂයේ දී යම් තැනැත්තකු විසින් කොමිසම වෙත යම් මුදලක් පරිත්‍යාග කරන ලද විට, එසේ පරිත්‍යාග කරන ලද මුදල, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ බදු අය කළ හැකි ආදායම ආගණනය කිරීමේ කාර්යය සඳහා ඔහුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කළ යුතු අතර, ඒ පරිත්‍යාගය බදු අය කළ හැකි ත්‍යාගයක් ලෙස ඒ පනතේ කාර්යය සඳහා නොසැලකිය යුතු ය.

(5) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ සහ රේගු ආඥා පනතේ පටහැනිව කුමක් සඳහන් වී තිබුණ ද, මේ වගන්තියේ විධිවිධාන බලාත්මක විය යුතු ය.

නව නිපැයුම් කරුවන් බදුවලින් නිදහස් කිරීම.

25. (1) කොමිසම විසින් අනුමත කරන ලද යම් නව නිපැයුමක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ යම් පුරවැසියකුට පේටන්ට් බලපත්‍රයක් ප්‍රදානය කර ඇති අවස්ථාවක දී, ඒ පේටන්ට් බලපත්‍රය දරන්නා විසින් ඒ පේටන්ට් බලපත්‍රය සම්බන්ධයෙන් නිෂ්පාදන භාග විශයෙන් හෝ වෙනත් ආකාරයකින් හෝ ලබන ආදායම, ඒ පේටන්ට් බලපත්‍රය ප්‍රදානය කරන ලද දිනයෙහි සිට අවුරුදු පහක කාලසීමාවකට, මෙහි මින් මතු සඳහන් වන විධිවිධානවලට යටත්ව, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ ගෙවිය යුතු වන යම් ආදායම් බද්දක්, ධන බද්දක් හෝ වෙනත් බද්දක් ගෙවීමට යටත් නොවන අතර, යම් ලිඛිත නීතියක් යටතේ ලබා ගත යුතු යයි නියමිත සියලු බලපත්‍රවලින් හෝ අවසර පත්‍රවලින් ඒ පේටන්ට් බලපත්‍රය දරන්නා නිදහස් විය යුතු ය.

(2) මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධාන පේටන්ට් බලපත්‍ර දරන්නන්ට—

(අ) ඒ පේටන්ට් බලපත්‍ර ලත් නව නිපැයුම් උපයෝගී කර ගැනීමට ආනුෂංගික වූ ගෙවා නිමි ප්‍රාග්ධනය රුපියල් දස ලක්ෂයක් ඉකුත් නොවන අවස්ථාවක; සහ

(ආ) ඒ පේටන්ට් බලපත්‍ර ලත් නව නිපැයුම ප්‍රකාර කරනු ලබන නිෂ්පාදන ඒ නව නිපැයුම්කරු විසින් ම ගෘහ කර්මාන්තයක් විශයෙන් කර ගෙන යනු ලබන අවස්ථාවක,

පමණක් අදාළ විය යුතු ය.

මුදල් වර්ෂය.

26. එක් එක් වර්ෂයේ ජනවාරි මස පළමුවන දිනයෙන් ආරම්භ වන මාස දොළහක් වූ කාල සීමාව කොමිසමේ මුදල් වර්ෂය විය යුතු ය.

විගණකාධිපතිවරයාගේ කාර්ය.

27. (1) කොමිසම විසින් තීරණය කරනු ලබන සහ මාස දොළහක් වූ කාල සීමාවක් නොඉක්මවන අතරවාරවල දී, විගණකාධිපතිවරයා විසින් කොමිසමේ ගිණුම් විගණනය කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන නොතකා, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සහ විගණකාධිපතිවරයා විමසා, අමාත්‍යවරයා විසින් කොමිසමේ ගිණුම් විගණනය කිරීම සඳහා සුදුසුකම් ලත් විගණකවරයකු හෝ විගණකවරුන් හෝ පත් කරනු ලැබිය හැකි ය. අමාත්‍යවරයා විසින් එවැනි පත් කිරීමක් කරන ලද අවස්ථාවක දී, කොමිසමට අදාළ ව, විගණකාධිපතිවරයාගේ කාර්ය ඉටු කිරීම සඳහා සහ කර්තව්‍ය කිරීම සඳහා ඒ

විගණකවරයාගේ හෝ විගණකවරුන්ගේ හෝ සේවය ලබා ගැනීමට තමා අදහස් කරන බව විගණකාධිපතිවරයා විසින් ලියවිල්ලකින් ඒ විගණකවරයාට හෝ විගණකවරුන්ට හෝ දැනුම් දිය හැකි අතර, එවිට ඒ විගණකවරයා හෝ විගණකරුවන් විසින් විගණකාධිපතිවරයාගේ විධානය හා පාලනය යටතේ ක්‍රියා කළ යුතු ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධාන යටතේ පත් කරනු ලැබූ සුදුසුකම් ලත් සෑම විගණකවරයකු විසින් තම වාර්තාව අමාත්‍යවරයා වෙත ද එහි පිටපතක් විගණකාධිපතිවරයා වෙත ද ඉදිරිපත් කළ යුතු ය.

(4) විගණකාධිපතිවරයා විසින් කොමිසමේ ගිණුම් පරීක්ෂාකොට, ශේෂ පත්‍රයේ නිරවද්‍යතාව නිශ්චිත වශයෙන් දැනගත යුතු අතර—

(අ) තමා ඉල්ලා සිටි සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් තමාට ලැබිණි ද නොලැබිණි ද යන වග ; සහ

(ආ) තම මතය අනුව, වාර්තාවෙහි සඳහන් කර ඇති ශේෂ පත්‍රය, තමා වෙත සපයන ලද සියලුම තොරතුරුවලට හා පැහැදිලි කිරීම්වලට අනුව ද කොමිසමේ පොත්වල දැක්වෙන අයුරුද කොමිසමේ කටයුතු පිළිබඳ සත්‍ය හා නිවැරදි දර්ශනයක් පිළිබිඹු වන පරිදි විධිමත්ව පිළියෙල කරන ලද්දක් ද යන වග

කොමිසමට වාර්තා කළ යුතු ය.

(5) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරීවරුන්ගේ ව්‍යාපාරික ආයතනයක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද ඒ ගණකාධිකාරීවරුන්ගේ ව්‍යාපාරික ආයතනය

අදහස් වේ.

28. කොමිසමේ කාර්ය ඉටු කිරීම පිළිබඳව සහ බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳව විශේෂ හෝ සාමාන්‍ය විධාන අමාත්‍යවරයා විසින් ලියවිල්ලකින් දිය හැකි අතර, කොමිසම විසින් ඒ විධාන ක්‍රියාත්මක කළ යුතුය.

කොමිසම වෙත විශේෂ හෝ සාමාන්‍ය විධාන නිකුත් කිරීමට අමාත්‍යවරයා සතු බලය.

29. කොමිසමේ සියලු නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ ඒ සංග්‍රහයේ කාර්යය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

කොමිසමේ නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

30. කොමිසම අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

කොමිසම, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.